ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
සමාජ විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව
11 මට්ටම -1 වර්ෂාර්ධය
අධ්‍යයන වර්ෂය - 2023/2024
අවසාන පරීක්ෂණය
**DSC1811 – ශ්‍රී ලංකාවේ නූතන ඉතිහාසය**
කාලය - පැය 03

දිනය : 2023. 12.02. වේලාව : පෙ. ව. 09.30 - ප.ව.12.30

උපදෙස් :

- ප්‍රශ්න පහකට(05) පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු විස්ස (20) බැගින් හිමි වේ.
- ඔබගේ පිළිතුරු පැහැදිලිව ලියන්න.
- ඔබගේ එක් පිළිතුරක් පිටු 03කට සීමා කරන්න.

1. "ශ්‍රී ලංකාවේ නූතන ඉතිහාස ලේඛනය ගැටලුවලින් තොර නොවේ." අදාළ උදාහරණ සමඟ සාකච්ඡා කරන්න.

2. "යටත් විජිත අධ්‍යයනය කිරීම ඒවා පාලනය කිරීමට ප්‍රමාණවත් නොවේ. යටත් විජිතවාදීන් ඒවා පාලනය කිරීම සඳහා යටත් විජිතවල මිෂනාරි අධ්‍යාපනය, සර්වජන ඡන්ද බලය, බටහිර වෛද්‍ය ක්‍රමය සහ පාර්ලිමේන්තුව (සියල්ලම යුරෝපයේ සංවර්ධනය වූ ඒවා ය) වැනි නූතන ආයතන පිහිටුවී ය." බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ යටත් විජිත ඉතිහාසය ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

3. ශ්‍රී ලංකාවට ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන් කාල සීමාව කෙරෙහි අවධානය යොමු කරමින් රාජ්‍යයේ ජනගහනය සහ එහි ආර්ථික ප්‍රතිපත්ති අතර ඇති අන්තර් සම්බන්ධය සාකච්ඡා කරන්න.

4. "යටත් විජිත සමයට පෙර පවා ශ්‍රී ලංකාවේ පොහොසත් තාක්ෂණික ඉතිහාසයක් පැවතිනි." ශ්‍රී ලාංකේය තාක්ෂණය පුරාණයේ සිට නූතනය දක්වා විකාශනය වූ ආකාරය විස්තර කරන්න.

5. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ සංවෘත ආර්ථික ප්‍රතිපත්තිය සහ J.R. ජයවර්ධන මහතාගේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය අතර වෙනස සාකච්ඡා කරන්න.

6. "පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය නොවන ක්‍රියාකාරීහු කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කළහ." ඔබ එකඟ වන්නේ ද නැතිනම් එකඟ නොවන්නේ ද? අදාළ උදාහරණවල සහායෙන් ඔබේ ස්ථාවරය දක්වන්න.

7. බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ ජීවිතවල සිදු වූ වෙනස්කම් විස්තර කරමින් අනන්‍යතා ගොඩනැගීමට යටත්විජිත පාලනයෙන් සිදුවූ බලපෑම සාකච්ඡා කරන්න.

8. පහත මාතෘකා දෙකක් (02) ගැන කෙටි සටහන් ලියන්න.
   a. ඉතිහාසය සහ ඓතිහාසික.
   b. යටත් විජිතවාදය සහ අධිරාජ්‍යවාදය.
   c. යටත් විජිත ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමයේ ලක්ෂණ.
   d. සමාජ මාධ්‍ය සහ ශ්‍රී ලංකා දේශපාලනය.
   e. නූතන ශ්‍රී ලංකාවට මුද්‍රණාලය හඳුන්වාදීම සහ එහි සාහිත්‍යමය වර්ධනය.

********** සියලුම හිමිකම් ඇවිරිණි **********